(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 4(10).]

පාර්ලිමේන්තුවේ අංක 4 දරන
න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

නිකුත් කළේ 2026 ඔක්තෝබර් 23 සිකුරාදා

2026 නොවැම්බර් 03 අඟහරුවාදා

යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

*

විදේශීය ත්‍රස්තවාදී සටන්කරුවන් වැළැක්වීමේ පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

සංවිධානාත්මක අපරාධ වැළැක්වීමේ පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා,— උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව (2022),— 1987 අංක 50 දරන උපරිමාධිකරණ සංකීර්ණය කළමනාකරණ මණ්ඩල පනතේ 11(2) වගන්තිය යටතේ 2023.11.22 දින ඉදිරිපත් කරන ලද, 2022.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලයේ 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.11.18 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2026.02.03 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා,— අපරාධයක විඳිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරියේ වාර්ෂික වාර්තාව (2022),— 2023 අංක 10 දරන අපරාධයක විඳිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනතේ 93(2) වගන්තිය යටතේ 2024.02.20 දින ඉදිරිපත් කරන ලද, 2022.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් අපරාධයක විඳිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරියේ 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.11.18 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2026.02.03 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා,— අපරාධයක විත්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරියේ වාර්ෂික වාර්තාව (2023),— 2023 අංක 10 දරන අපරාධයක විත්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනතේ 93(2) වගන්තිය යටතේ 2025.08.07 දින ඉදිරිපත් කරන ලද, 2023.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් අපරාධයක විත්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරියේ 2023 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.11.18 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2026.02.03 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව (2022),— ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 27 දරන නීති ආධාර පනතේ 24(2) වගන්තිය යටතේ 2024.06.19 දින ඉදිරිපත් කරන ලද, 2022.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාවේ 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.11.18 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2026.02.03 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව (2023),— ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 27 දරන නීති ආධාර පනතේ 24(2) වගන්තිය යටතේ 2025.08.19 දින ඉදිරිපත් කරන ලද, 2023.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාවේ 2023 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.11.18 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2026.02.03 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා,— රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව (2020),— 1991 අංක 18 දරන රාජ්‍ය භාෂා කොමිෂන් සභා පනතේ 32 වගන්තිය යටතේ 2023.07.05 දින ඉදිරිපත් කරන ලද, 2020.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ 2020 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2024.04.26 සහ 2025.11.18 යන දිනයන්හි දී සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2026.02.03 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා,— රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව (2021),— 1991 අංක 18 දරන රාජ්‍ය භාෂා කොමිෂන් සභා පනතේ 32 වගන්තිය යටතේ 2024.01.09 දින ඉදිරිපත් කරන ලද, 2021.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ 2021 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2024.04.26 සහ 2025.11.18 යන දිනයන්හි දී සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2026.02.03 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා,— රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව (2022),— 1991 අංක 18 දරන රාජ්‍ය භාෂා කොමිෂන් සභා පනතේ 32 වගන්තිය යටතේ 2024.06.04 දින ඉදිරිපත් කරන ලද, 2022.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.11.18 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2026.02.03 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා,— රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව (2023),— 1991 අංක 18 දරන රාජ්‍ය භාෂා කොමිෂන් සභා පනතේ 32 වගන්තිය යටතේ 2025.06.20 දින ඉදිරිපත් කරන ලද, 2023.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ 2023 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.11.18 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2026.02.03 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා,— ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයේ වාර්ෂික වාර්තාව (2022),— 2007 අංක 26 දරන ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය පනතේ 23 වගන්තිය යටතේ 2024.07.24 දින ඉදිරිපත් කරන ලද, 2022.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයේ 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.11.18 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2026.02.03 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා,— ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයේ වාර්ෂික වාර්තාව (2023),— 2007 අංක 26 දරන ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය පනතේ 23 වගන්තිය යටතේ 2025.10.10 දින ඉදිරිපත් කරන ලද, 2023.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයේ 2023 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.11.18 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2026.02.03 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

2026 නොවැම්බර් 04 බදාදා

යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

*

භාර (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

(2026 නොවැම්බර් 04 බදාදා)

2338/2026

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2025.12.31 දිනට —

(i) ශ්‍රේෂ්ඨාධිකරණයේ, අභියාචනාධිකරණයේ, සිවිල් අභියාචනා මහාධිකරණවල, වාණිජ මහාධිකරණවල, මහාධිකරණවල, දිසා අධිකරණවල, මහෙස්ත්‍රාත් අධිකරණවල, ළමා මහෙස්ත්‍රාත් අධිකරණවල සහ කම්කරු විනිශ්චය සභාවන්වල පවතින නඩු සංඛ්‍යාව;

(ii) 2020 වර්ෂයේ සිට 2026 වර්ෂය දක්වා වර්ෂවල ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ ගොනු කරන ලද මූලික අයිතිවාසිකම් නඩු සංඛ්‍යාව, වර්ෂ අනුව;

(iii) එම නඩු අතරින් 'නඩුව ඉදිරියට ගෙන යාම සඳහා' ශ්‍රේෂ්ඨාධිකරණය විසින් අවසර ලබා දුන් නඩු සංඛ්‍යාව, එක් එක් වර්ෂය අනුව;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මහෙස්ත්‍රාත් අධිකරණවල පවතින නඩු සංඛ්‍යාව, ඉහත සඳහන් සියලු අධිකරණ හා විනිශ්චය සභාවන්හි පවතින මුළු නඩු සංඛ්‍යාවෙන් කොපමණ ප්‍රතිශතයක්ද;

(ii) දිසා අධිකරණවල පවතින නඩු සංඛ්‍යාව, ඉහත සඳහන් සියලු අධිකරණ හා විනිශ්චය සභාවන්හි පවතින මුළු නඩු සංඛ්‍යාවෙන් කොපමණ ප්‍රතිශතයක්ද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2389/2026

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා,— විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2026 වර්ෂය සඳහා විදේශ රැකියා සඳහා යොමු කිරීමට ඉලක්කගත සංඛ්‍යාව කොපමණද;

(ii) 2026.01.01 දින සිට 2026.06.30 දිනට විදේශ රැකියා සඳහා යොමු කළ සංඛ්‍යාව කොපමණද;

(iii) ඉලක්කගත සංඛ්‍යාව සපුරා ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ වනවිට තානාපතිවරයෙකු නොමැති ශ්‍රී ලංකා දූත මණ්ඩල සහ පුරප්පාඩුවී පවතින කාලසීමාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) දූත මණ්ඩල ප්‍රධානීන් අතරින් ශ්‍රී ලංකා විදේශ සේවයට අයත් සහ බාහිරව පත් කර ඇති සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) 2025.01.01 දින සිට මේ දක්වා අමාත්‍යාංශය විසින් විදේශ සංචාර සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(ii) සංචාරය කරන ලද රටවල්, දිනයන්, සංචාරයට සම්බන්ධවූ සංඛ්‍යාව සහ සංචාරවල අරමුණු කවරේද;

(iii) එම එක් එක් සංචාරය සඳහා ගුවන් ගමන්, නවාතැන් සහ දීමනා ඇතුළු මුළු වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) අත්සන් කළ ගිවිසුම්, අවබෝධතා ගිවිසුම් සහ ලබාගත් ප්‍රතිලාභ වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

(2026 නොවැම්බර් 05 බ්‍රහස්පතින්දා)

2339/2026

ගරු අජිත් පී. පෙරේරා මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව හෝ ආයුර්වේද දෙපාර්තමේන්තුව හරහා 'ආයුර්වේද', 'සිද්ධ', 'යුනානි' සහ 'හෝමියෝපති' වෛද්‍ය අධ්‍යාපනයට අදාළ පාඨ ග්‍රන්ථ මුද්‍රණය කරනු ලබන්නේද;

(ii) එසේ නම්, අවසන් වරට පාඨ ග්‍රන්ථ මුද්‍රණය කරන ලද වර්ෂය සහ විෂයයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පාරම්පරික වෛද්‍ය ක්‍රම පෝෂණය කිරීම සඳහා පසුගිය වර්ෂ 05 තුළ රජය විසින් මුද්‍රණය කර ඇති පාඨ ග්‍රන්ථ කවරේද;

(ii) නොඑසේ නම්, ඒ මන්ද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2340/2026

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නඩු කටයුත්තකදී දරුවෙකුගේ පිතෘත්වය හෝ මාතෘත්වය සම්බන්ධයෙන් මතභේදයක් පැනනගින අවස්ථාවලදී, එම ප්‍රශ්නය විසඳීම සඳහා ජාන පරීක්ෂණ (DNA Tests) භාවිත කිරීමේ නීතිමය ප්‍රතිපාදන ඇති බවත්;

(ii) 1999 අංක 37 දරන නඩත්තු පනත යටතේ පවරනු ලබන නඩුවකදී පිතෘත්වය හෝ මාතෘත්වය සම්බන්ධයෙන් මතභේදයක් පැනනගින අවස්ථාවක, ජාන පරීක්ෂණයක් සඳහා අවශ්‍ය සාම්පල ලබාදෙන ලෙස නියෝග කිරීමට මහෙස්ත්‍රාත් අධිකරණයට බලය නොමැති බවත්;

(iii) දරුවෙකුගේ පිතෘත්වය හෝ මාතෘත්වය සම්බන්ධයෙන් දිසා අධිකරණය හමුවේ පවතින නඩු කටයුත්තකදී, ජාන පරීක්ෂණයක් සඳහා අවශ්‍ය සාම්පල ලබාදෙන ලෙස පාර්ශ්වයකට නියෝග කිරීමට ප්‍රමාණවත් ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එවැනි නීතිමය ඌනතා නිරාකරණය කිරීම සඳහා අවශ්‍ය ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන හඳුන්වාදීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, සංශෝධනය කිරීමට හෝ හඳුන්වාදීමට අපේක්ෂිත නීති කවරේද;

(iii) එම නීති හඳුන්වාදීමට අපේක්ෂිත කාල රාමුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2393/2026

ගරු තුරෙරාසා රවිකරන් මහතා,— කම්කරු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 'ශ්‍රම වාසනා අරමුදල' මඟින් සපයන ලද සේවාවන් අතරින් කම්කරු අමාත්‍යාංශය විසින් අඛණ්ඩව සැපයීමට නියමිත සේවාවන් කවරේද;

(ii) අමාත්‍යාංශය විසින් තවදුරටත් සෘජුව පවත්වාගෙන නොයන සේවාවන් සහ එම සේවාවන් භාර ගැනීමට නියමිත ආයතන කවරේද;

(iii) එම සේවාවන් පැවරීම සඳහා සංක්‍රාන්ති ක්‍රියාකාරී සැලැස්මක් හා කාලරාමුවක් සකස් කර තිබේද;

(iv) සංක්‍රාන්ති කාලසීමාව තුළ ප්‍රතිලාභීන්ට සේවා හෝ ප්‍රතිලාභ අහිමි නොවීම සහතික කිරීමට ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

(2026 නොවැම්බර් 06 සිකුරාදා)

2394/2026

ගරු තුරෙරාසා රවිකරන් මහතා,— කම්කරු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 'ශ්‍රම වාසනා අරමුදලේ' සේවාවන් සඳහා අයදුම්පත්, මාර්ගෝපදේශ, සුදුසුකම් සපිරීමේ කොන්දේසි සහ අනෙකුත් තොරතුරු සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා ත්‍රිත්වයෙන් ලබාදී තිබේද;

(ii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

(iii) අමාත්‍යාංශය එම සේවාවන් භාර ගැනීමෙන් පසු අයදුම්පත්, මාර්ගෝපදේශ, මාර්ගගත සේවා සහ තීන්දු පිළිබඳ ලිපි භාෂා ත්‍රිත්වයෙන් ලබා දීමට පියවර ගන්නේද;

(iv) එසේ නම්, ඒ සඳහා වන කාලරාමුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අරමුදලේ සේවාවන් සඳහා අමාත්‍යාංශය යටතේ ඇති සෑම දිස්ත්‍රික් කම්කරු කාර්යාලයකටම සෘජුව අයදුම්පත් ඉදිරිපත් කිරීමට පහසුකම් සලසන්නේද;

(ii) අන්තර්ජාල පහසුකම් හෝ ප්‍රමාණවත් ඩිජිටල් සාක්ෂරතාවයක් නොමැති සේවකයන් සඳහා සෘජුව හෝ තැපෑලෙන් අයදුම් කිරීමට විකල්ප පහසුකම් සලසන්නේද;

(iii) මුලතිව්, මන්නාරම හා වවුනියා දිස්ත්‍රික්ක සඳහා සම්බන්ධීකරණ නිලධාරීන් පත් කරන්නේද;

(iv) ග්‍රාමීය හා අවිධිමත් අංශයේ සේවකයන් දැනුම්වත් කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2497/2026

ගරු ජේ.සී. අලවතුවල මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාතික ජන බලවේග රජයේ 'පොහොසත් රටක්-ලස්සන ජීවිතයක්' ප්‍රතිපත්ති ප්‍රකාශයේ 86 වැනි පිටුවෙහි සඳහන් රාජ්‍ය සේවයට බඳවාගැනීමේදී දැනට පවතින තරඟ විභාග ක්‍රමය නවීකරණය කර තෝරා ගැනීමේ පටිපාටිය යාවත්කාලීන කිරීම යන යෝජනාව, 2026.09.01 දිනය වනවිට ඉටුකර තිබේද;

(ii) එසේ නම්, එහි මූල්‍ය/භෞතික ප්‍රගතිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2498/2026

ගරු ජේ.සී. අලවතුවල මහතා,— ඩිජිටල් ආර්ථික අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාතික ජන බලවේග රජයේ 'පොහොසත් රටක්-ලස්සන ජීවිතයක්' ප්‍රතිපත්ති ප්‍රකාශයේ 102 වැනි පිටුවෙහි සඳහන් රාජ්‍ය සේවා ලබා ගැනීම හා රජය සමඟ කටයුතු කිරීමට සෑම පුරවැසියෙකුටම නිශ්චිත ඩිජිටල් හඳුනාගැනීමේ කේතයක් ලබාදීම යන යෝජනාව 2026.09.01 දිනය වනවිට ඉටුකර තිබේද;

(ii) එසේ නම්, එහි මූල්‍ය/භෞතික ප්‍රගතිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

(2026 නොවැම්බර් 13 සිකුරාදා)

2341/2026

ගරු අජිත් පී. පෙරේරා මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ 'දේශීය පාරම්පරික වෛද්‍ය ක්‍රමය' පවත්වාගෙන යාමට දේශීය පාරම්පරික වෛද්‍යවරුන් දායකවී ඇති බවත්;

(ii) එම වෛද්‍ය ක්‍රම ගුරු-ගෝල පදනම මත පාරම්පරිකව පැවත ආ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) පසුකාලීනව 'වෛද්‍ය තක්සලාව' (ගුරුකුල) ක්‍රමය මඟින් එම වෛද්‍ය ක්‍රමය පෝෂණයවී ව්‍යාප්තවූ බවත්;

(ii) විවිධ රෝග සඳහා විශේෂිත ප්‍රවීණ වෛද්‍ය පරම්පරා රට පුරා පැවති බවත්;

(iii) අඛණ්ඩව පැවත ආ එම වෛද්‍ය ක්‍රමය වර්තමානයේ 'ජාතික උරුමයක්' ලෙස සැලකිය යුතු බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) ලෝක සෞඛ්‍ය සංවිධානය සහ යුනෙස්කෝ සංවිධානය මඟින් ස්වදේශීය වෛද්‍ය ක්‍රම සංරක්ෂණය කළ යුතු බව ප්‍රකාශ කර තිබේද;

(ii) එම ප්‍රතිපත්තිවලට අනුකූලව එම වෛද්‍ය ක්‍රමය සංරක්ෂණය හා පවත්වාගෙන යාම සඳහා රජය ගෙන ඇති පියවර කවරේද;

(iii) පාරම්පරික වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීම සඳහා සකස් කර ඇති නව නීති කෙටුම්පත මඟින් එම ජාත්‍යන්තර ප්‍රතිපත්ති ආරක්ෂා වන බව තහවුරු කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

(2026 නොවැම්බර් 14 සෙනසුරාදා)

2342/2026

ගරු අජිත් පී. පෙරේරා මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 'ආයුර්වේද ඖෂධ සංග්‍රහය' සංශෝධනය කිරීම මඟින් පාරම්පරික වෛද්‍යවරුන්ට ඔවුන්ට ආවේණික ඖෂධ මඟින් ප්‍රතිකාර කිරීම තහනම් වන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පාරම්පරික වෛද්‍ය සිසුන්ට මූලික සිද්ධාන්ත ලබාදීම සඳහා රජය සතුව විධිමත් වැඩපිළිවෙළක් තිබේද;

(ii) ලිඛිත විභාගයට පෙනී සිටීමට පෙර එම සිසුන් අධීක්ෂණය කිරීම සඳහා පත්කර ඇති නිලධාරීන් කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) වෛද්‍ය සභාව විසින් ප්‍රජා සෞඛ්‍ය නිලධාරීන් හරහා පාරම්පරික වෛද්‍ය සිසුන්ගේ සංඛ්‍යාව තීරණය කිරීමට බලය ලබාදී තිබේද;

(ii) එසේ නම්, එම නීතිමය ප්‍රතිපාදනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

(2026 නොවැම්බර් 16 සඳුදා)

2499/2026

ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාතික ජන බලවේග රජයේ 'පොහොසත් රටක්-ලස්සන ජීවිතයක්' ප්‍රතිපත්ති ප්‍රකාශයේ 115 වැනි පිටුවෙහි සඳහන් 'සාධාරණ මිලට පොහොර ඇතුළු කෘෂි යෙදවුම් ලබාදීම' සහ 'යහපත් කෘෂිකාර්මික පිළිවෙත්වලට අනුව රසායනික සහ කාබනික පොහොර ඇතුළු කෘෂි යෙදවුම් සඳහා සහනාධාර' යන යෝජනා 2026.09.01 දින වනවිට ඉටුකර තිබේද;

(ii) එසේ නම්, එහි මූල්‍ය/භෞතික ප්‍රගතිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

(2026 නොවැම්බර් 17 අඟහරුවාදා)

2500/2026

ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා,— මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාතික ජන බලවේග රජයේ 'පොහොසත් රටක්-ලස්සන ජීවිතයක්' ප්‍රතිපත්ති ප්‍රකාශයේ 103 වැනි පිටුවෙහි සඳහන් 'ආදාන වැට් බද්ද (Input VAT) මත වන අපනයන සංවර්ධන බදු අපනයනකරුවන්ට කඩිනමින් ආපසු ලබාදීම' යන යෝජනාව, 2026.09.01 දින වනවිට ඉටුකර තිබේද;

(ii) එසේ නම්, එහි මූල්‍ය/භෞතික ප්‍රගතිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

(2026 නොවැම්බර් 18 බදාදා)

2501/2026

ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා,— මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාතික ජන බලවේග රජයේ 'පොහොසත් රටක්-ලස්සන ජීවිතයක්' ප්‍රතිපත්ති ප්‍රකාශයේ 68 වැනි පිටුවෙහි සඳහන් 'රටේ සියලුම අංශවල ශ්‍රමිකයන්ට අදාළ වන පරිදි විශ්‍රාම වැටුප් පිළිබඳ පුළුල් ප්‍රතිපත්තියක් සකස් කර ක්‍රියාත්මක කිරීම' යන යෝජනාව, 2026.09.01 දිනය වනවිට ඉටුකර තිබේද;

(ii) එසේ නම්, එහි මූල්‍ය/භෞතික ප්‍රගතිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

(2026 නොවැම්බර් 19 බ්‍රහස්පතින්දා)

2512/2026

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා,— ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 'ලංකා මෙට්‍රෝ ට්‍රාන්සිට්' (LMT) පුද්ගලික ආයතනය, ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ව්‍යවස්ථාව ප්‍රකාරව ජාතික විගණන කාර්යාලයේ විගණනයට යටත් වන්නේද;

(ii) එම ආයතනය සඳහා මේ දක්වා සිදුකර ඇති බඳවාගැනීම් සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන තිබේද;

(iii) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවකයන්ගේ වැටුප් ව්‍යුහයට සාපේක්ෂව, මෙම ආයතනයේ සේවකයන්ගේ වැටුප් අතර විෂමතාවයක් තිබේද;

(iv) මණ්ඩලය සතු පළපුරුදු රියදුරන්ට හා කොන්දොස්තරවරුන්ට ලංකා මෙට්‍රෝ ට්‍රාන්සිට් ආයතනයේ සේවයට එක්වීම සඳහා සාධාරණ අවස්ථාවක් ලබාදී තිබේද;

(v) නොඑසේ නම්, ඒ මන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2026 නොවැම්බර් 20 සිකුරාදා

වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

374/2025

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කළුතර අධිකරණ සංකීර්ණයේ රථගාල අවිධිමත් ලෙස ස්ථානගත කර ඇති බව දන්නේද;

(ii) එම රථගාල නිසි ප්‍රමිතියකට සකස් කර රථවාහන තදබදය අවම කිරීම සඳහා පියවර ගන්නේද;

(iii) රථගාල සංවර්ධනය කිරීම ප්‍රමුඛ කාර්යයක් ලෙස ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන තිබේද;

(iv) රථගාල නිසි ප්‍රමිතියට සකස් කිරීම සඳහා ඇස්තමේන්තු කරන ලද මුළු පිරිවැය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

479/2025

ගරු රවී කරුණානායක මහතා,— ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉන්දියාවේදී සහ මාලදිවයිනේදී ශ්‍රී ලාංකික ධීවරයින් අත්අඩංගුවට ගැනීමේ සිද්ධීන් සංඛ්‍යාව ඉහළ යාම වැළැක්වීමට ගත හැකි පියවර කවරේද;

(ii) එවැනි අත්අඩංගුවට ගැනීම් සඳහා බලපා ඇති ප්‍රධාන හේතු කවරේද;

(iii) ධීවර යාත්‍රා සඳහා ගෝලීය ස්ථාන නිර්ණයන පද්ධති (GPS) උපකරණ භාවිතය අනිවාර්ය කිරීම මෙම සිද්ධීන් අවම කර ගැනීමට දායකවී තිබේද;

(iv) ශ්‍රී ලංකා මුහුදු සීමාව තුළදී ඉන්දීය ධීවරයින් අත්අඩංගුවට ගැනීමට බලපාන ප්‍රධාන හේතු කවරේද;

(v) ශ්‍රී ලංකාව, ඉන්දියාව සහ මාලදිවයින යන රටවලදී අත්අඩංගුවට පත්වන ධීවරයින්ට අදාළ නීතිමය ක්‍රියාපටිපාටි සඳහා දීර්ඝ කාලයක් ගතවීම සහ අධික පිරිවැයක් දැරීමට සිදුවීම සැලකිල්ලට ගනිමින්, එම නීතිමය ක්‍රියාපටිපාටි කඩිනම් කිරීමට ගත හැකි පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

708/2025

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ සිටි/සිටින එළ ගවයන් සංඛ්‍යාව සහ මී ගවයන් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම එළ ගවයන් හා මී ගවයන් සංඛ්‍යාව අඩුවී තිබේද;

(iii) නොඑසේ නම්, වැඩිවී තිබේද;

(iv) එළ ගවයන් හා මී ගවයන් සංඛ්‍යාව අඩුවී තිබේ නම්, එය ශ්‍රී ලංකාවේ දියර කිරි නිෂ්පාදනයට බාධාවක් බව පිළිගන්නේද;

(v) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2414/2026

ගරු තිළිණ සමරකෝන් මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ, මහඉලුප්පල්ලම පිහිටි අමාත්‍යාංශයට අයත් ආයතන කවරේද;

(ii) එම එක් එක් ආයතනයේ කාර්යභාරය සහ වර්තමාන කෘෂිකර්ම ක්ෂේත්‍රයට දක්වන දායකත්වය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම ආයතන පවත්වාගෙන යාම සහ එහි කාර්යයන් සඳහා 2025 සහ 2026 වර්ෂවල වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම එක් එක් ආයතනයේ සේවක සංඛ්‍යාව සහ 2025 හා 2026 වර්ෂවල වැටුප් හා අතිකාල සඳහා වැය කර ඇති මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) එම ආයතන සඳහා ඉදිරි වර්ෂ 05 සඳහා සංයුක්ත සැලැස්මක් සකස් කර තිබේද;

(vi) එසේ නම්, එහි අපේක්ෂිත ප්‍රධාන ඉලක්ක කවරේද;

(vii) එම ආයතන සතු භාවිතයේ පවතින හා භාවිතයට නොගන්නා ගොඩනැගිලි සංඛ්‍යාව සහ නිල නිවාස සංඛ්‍යාව, ඒවායේ භාවිත තත්ත්වය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2508/2026

ගරු නීතිඥ හිරුනි විජේසිංහ මහත්මිය,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ප්‍රධාන මෝය කටවල් සහ ජලවහන පද්ධති වත්මන් දේශගුණික විපර්යාස හේතුවෙන් ඇතිවන අධික වර්ෂාපතනයට මුහුණ දීමට ප්‍රමාණවත් ධාරිතාවයකින් යුක්ත නොවන බව පිළිගන්නේද;

(ii) ගංවතුර පාලනය සඳහා ජලය ක්‍රමානුකූලව හා වේගයෙන් මුහුදට ගලා යා හැකි වන පරිදි ජලවහන පද්ධති යාවත්කාලීන කිරීමේ වැඩපිළිවෙළක් තිබේද;

(iii) ශ්‍රී ලංකාවේ ප්‍රධාන ජල පෝෂක ප්‍රදේශ හා ජලවහන මාර්ග ඇතුළත් නවීන විද්‍යාත්මක 'ජාතික ජලවහන සිතියමක්' සකස් කිරීම, මෝය කටවල්වල අවහිරතා ඉවත් කිරීම, අධික වර්ෂාපතන තත්ත්වවලදී පවා ජලය කාර්යක්ෂමව ගලා යා හැකි වන පරිදි විශාල පරිමාණ ජලවහන තාක්ෂණය යොදා ගැනීම සහ අනාගත ගංවතුර අවදානම අවම කිරීම සඳහා භූ-විද්‍යාත්මක හා ජලවිද්‍යාත්මක දත්ත මත පදනම්වූ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් ගෙන ඇති පියවර කවරේද;

(iv) එම වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීම සඳහා වෙන් කර ඇති මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණය කොපමණද;

(v) ඒ සඳහා ගතවන කාලසීමාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

(2026 නොවැම්බර් 20 සිකුරාදා)

2513/2026

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා,— වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අධික රඳවා තබාගැනීමේ ගාස්තු ගෙවීමට නොහැකි වීම හේතුවෙන් වාහන විශාල සංඛ්‍යාවක් හම්බන්තොට මහින්ද රාජපක්ෂ වරාය පරිශ්‍රයේ රඳවා පවතින බව එතුමා දන්නෙහිද;

(ii) මෙලෙස වරාය තුළ අතහැර දමා ඇති මුළු වාහන සංඛ්‍යාව කොපමණද;

(iii) එම වාහන මෙරටට ආනයනය කරන ලද වර්ෂ කවරේද;

(iv) වාහන වරායෙන් නිදහස් කර නොගැනීමට බලපා ඇති ප්‍රධාන හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) දීර්ඝ කාලයක් තිස්සේ වරාය පරිශ්‍රයේ මෙලෙස වාහන ගොඩගැසී තිබීම නිසා වරායේ මෙහෙයුම් කටයුතු හා ඉඩකඩ කළමනාකරණයට එල්ලවී ඇති බලපෑම කවරේද;

(ii) මෙම අතහැර දමා ඇති වාහන සඳහා සහන කාලයක් හෝ ගාස්තු සහනයක් ලබාදී නිදහස් කිරීමට පියවර ගන්නේද;

(iii) නොඑසේ නම්, ඒවා රාජසන්තක කර ප්‍රසිද්ධ වෙන්දේසියකින් විකිණීමට හෝ රජයේ ආයතනයන්හි පරිහරණය සඳහා ලබාදීමට සැලසුම් කර තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2026 නොවැම්බර් 21 සෙනසුරාදා

වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1022/2025

ගරු (ආචාර්ය) එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලාහ් මහතා,— ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය රජය මඟින් නාගරික සංවර්ධන අධිකාරිය හරහා ක්‍රියාත්මක කළ නිවාස ව්‍යාපෘති මඟින් අඩු ආදායම්ලාභී පවුල් සඳහා නිවාස ලබාදුන් බව දන්නේද;

(ii) එම නිවාස ව්‍යාපෘතිය මධ්‍යකලපුව දිස්ත්‍රික්කය තුළ ආරම්භ කිරීමට සැලසුම් කර තිබූ නමුත් එය නවතා ඇති බව දන්නේද;

(iii) ව්‍යාපෘතිය නැවත ආරම්භ කිරීම සඳහා අධිකාරිය හරහා මුදල් වෙන් කර තිබේද;

(iv) එසේ නම්, ඒ සඳහා වෙන් කර ඇති මුළු මුදල කොපමණද;

(v) එම මුදල එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වශයෙන් කොපමණද;

(vi) එම දිස්ත්‍රික්කයේ ව්‍යාපෘතිය යටතේ නිවාස බෙදාදීමට නියමිත ප්‍රතිලාභීන්ගේ නම් ලැයිස්තුව ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1227/2025

ගරු රෝහිණි කුමාරි විජේරත්න මහත්මිය,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2022 අංක 11 දරන පනතින් සංශෝධිත ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19(4) වගන්තිය යටතේ දීමනා පත්‍ර මඟින් රජයේ ඉඩම් හිමිකම් ලබාගෙන ඇති පුද්ගලයන් සඳහා පසුගිය රජය විසින් 'උරුමය' නමින් වැඩසටහනක් ක්‍රියාත්මක කරනු ලැබුවේද;

(ii) එම වැඩසටහන යටතේ 'උරුමය' නිදහස් දීමනා පත්‍ර ලබාගැනීම සඳහා, මීට පෙර නිකුත් කර තිබූ දීමනා පත්‍ර, ප්‍රතිලාභීන් විසින් රජයට භාරදී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම වැඩසටහන මේ වනවිට ක්‍රියාත්මක වන්නේද;

(ii) එසේ නම්, එහි වර්තමාන ප්‍රගතිය කවරේද;

(iii) මේ දක්වා නිකුත් කර ඇති 'උරුමය' නිදහස් දීමනා පත්‍ර සංඛ්‍යාව කොපමණද;

(iv) තවදුරටත් නිකුත් කිරීමට නියමිත දීමනා පත්‍ර සංඛ්‍යාව කොපමණද;

(v) එම වැඩසටහන අත්හිටුවා තිබේ නම්, ඒ බවට නිල ප්‍රකාශයක් නිකුත් කර තිබේද;

(vi) වැඩසටහන නිල වශයෙන් අත්හිටුවා ඇත්නම්, ප්‍රතිලාභීන්ගෙන් රජයට භාරගත් දීමනා පත්‍ර නැවත ඔවුන්ට භාරදීමට කටයුතු කරන්නේද;

(vii) එසේ නම්, එය සිදු කරන දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1382/2025

ගරු නීතිඥ වමින්ද්‍රාණී කිරිඇල්ල මහත්මිය,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ ව්‍යාත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉන්දියානු ආධාර යටතේ වතු පාසල් 09ක් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කළ දිනය කවරේද;

(ii) ඒ සඳහා අනුමත මුදල් ප්‍රමාණය කොපමණද;

(iii) මේ දක්වා එම ව්‍යාපෘතියේ කිසිදු කටයුත්තක් ආරම්භවී නොමැති බව දන්නේද;

(iv) එම ව්‍යාපෘතිය කඩිනමින් ආරම්භ කර ක්‍රියාත්මක කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1951/2026

ගරු ලාල් ප්‍රේමනාත් මහතා,— වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යාතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ තේ නිෂ්පාදකයින්ගේ සමුපකාර සමිතියේ සිදුව ඇතැයි පැවසෙන මූල්‍ය වංචාව සම්බන්ධයෙන්වූ විමර්ශන වාර්තාව අමාත්‍යාංශය විසින් පිළිගෙන තිබේද;

(ii) එම මහජන මුදල අදාළ පුද්ගලයන්ගේ පෞද්ගලික දේපළවලින් අයකර ගැනීම සඳහා ගෙන ඇති හෝ ගැනීමට නියමිත ක්‍රියාමාර්ග කවරේද;

(iii) එම සිද්ධිය සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත පැමිණිලි කර තිබේද;

(iv) සිද්ධියට සම්බන්ධ පුද්ගලයන් වෙනත් සමුපකාර සමිතිවල තනතුරු දැරීම වැළැක්වීම සඳහා ගෙන ඇති හෝ ගැනීමට නියමිත ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2415/2026

ගරු සුසන්ත කුමාර නවරත්න මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ, ස්ථාපිත කර ඇති වෘත්තීය අධ්‍යාපන ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ආයතන කවරේද;

(iii) එම එක් එක් ආයතනයේ අධ්‍යාපනය ලබන ශිෂ්‍ය සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) මෙම ආයතනවල මේ වනවිට ක්‍රියාත්මක වන පාඨමාලා කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

(2026 නොවැම්බර් 21 සෙනසුරාදා)

2527/2026

ගරු රවී කරුණානායක මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ආහාර (ට්‍රාන්ස්-මේද) නියෝග (අංක 2319/41 දරන අති විශේෂ ගැසට් පත්‍රය) සම්බන්ධයෙන්—

(i) 2443/07 සහ 2485/54 දරන ගැසට් පත්‍ර මඟින් එම නියෝග ක්‍රියාත්මක කිරීම කල් දැමීමට හේතු කවරේද;

(ii) එම කල් දැමීම් සඳහා හේතුවූ ආහාර උපදේශක කමිටුවේ සහ තාක්ෂණික අනුකමිටුවේ නිර්දේශ ලබා දුන් දින සහ නිර්දේශ කවරේද;

(iii) අංක 2485/54 දරන ගැසට් පත්‍රය මඟින් ට්‍රාන්ස්-මේද සඳහා වන සංශෝධිත අර්ථ දැක්වීම ක්‍රියාත්මක කරන දිනයක් ඇතුළත් කිරීම මහහැර තිබේද;

(iv) එසේ නම්, එම මහහැරීම නිවැරදි කිරීමට ගෙන ඇති පියවර කවරේද;

(v) එය තවදුරටත් කල් දැමීමට අපේක්ෂා කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම කල් දැමීම් කෙරෙහි කර්මාන්ත ක්ෂේත්‍රයේ පාර්ශ්වකරුවන් විසින් ඉදිරිපත් කළ අදහස් හා යෝජනා බලපා තිබේද;

(ii) එසේ නම්, ඒ පිළිබඳ විස්තර කවරේද;

(iii) මෙම ගැසට් නිවේදන නිකුත් කිරීම සඳහා දරන ලද මුළු පිරිවැය කොපමණද;

(iv) 1980 අංක 26 දරන ආහාර පනතේ 32(2) වගන්තිය යටතේ මෙම නියෝග සහ සංශෝධන පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද දින කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2026 නොවැම්බර් 23 සඳුදා

වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1003/2025

ගරු මුජීබුර් රහුමාන් මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ මහ නගර සභා බල ප්‍රදේශයේ දිනකට බැහැර කෙරෙන කසළ ප්‍රමාණයේ සාමාන්‍ය අගය කොපමණද;

(ii) කොළඹ නගරයේ මේ වනවිට කසළ බැහැර කරන ස්ථාන කවරේද;

(iii) කොළඹ නගරයේ කසළ පුත්තලම, අරුවක්කාලු ප්‍රදේශය වෙත ප්‍රවාහනය කිරීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මකවූ බව දන්නේද;

(iv) එම ව්‍යාපෘතිය සඳහා මෙතෙක් වැය කර ඇති මුදල් ප්‍රමාණය කොපමණද;

(v) ව්‍යාපෘතියේ ඉදිරි කටයුතු සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1225/2025

ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) දිවයින පුරා පිහිටි ප්‍රමාණවත් ශිෂ්‍ය සංඛ්‍යාවක් නොමැති පාසල් සහ අධික තදබදයක් සහිත පාසල් අතර වර්ධනය වන විෂමතාවලට විසඳුම් සෙවීම සඳහා ජාතික ප්‍රතිපත්තියක් තිබේද;

(ii) අධික තදබදයක් සහිත පාසල්වල යටිතල පහසුකම්, ගුරු සම්පත් සහ පන්ති කාමරවල පහසුකම් ඉහළ නැංවීම සඳහා කෙටි කාලීන සහ දිගු කාලීන සැලසුම් සකස් කර තිබේද;

(iii) දුරස්ථ ප්‍රදේශවල සිටින ශිෂ්‍යයන්ගේ අධ්‍යාපනය ලැබීමේ අයිතියට බාධාවක් නොවන පරිදි, ප්‍රමාණවත් ශිෂ්‍ය සංඛ්‍යාවක් නොමැති ග්‍රාමීය සහ වතුකරයේ පාසල් ඒකාබද්ධ කිරීමට හෝ ඒවා නැවත සංවර්ධනය කිරීමට උපායමාර්ගික සැලසුම් තිබේද;

(iv) ගුරු හිඟය සහ අතිරික්තය වැළැක්වීම සඳහා, ලියාපදංචිවී ඇති සැබෑ සිසුන් සංඛ්‍යාවට අනුපාතිකව ගුරුවරුන් වෙන් කිරීමේ සහ අනුයුක්ත කිරීමේ ප්‍රතිපත්තියක් තිබේද;

(v) අධික තදබදය සහිත පාසල් සහ ප්‍රමාණවත් ශිෂ්‍ය සංඛ්‍යාවක් නොමැති පාසල්වල අධ්‍යාපනික පහසුකම්, තාක්ෂණ පහසුකම් සහ බාහිර ක්‍රියාකාරකම් සඳහා වන අවස්ථා සාධාරණ පරිදි ලබා දීම තහවුරු කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1341/2025

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා,— ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ මුහුදු තීරය ආශ්‍රිතව සහ ශ්‍රී ලංකා මුහුදු කලාපය තුළ වාර්තාවී ඇති නෞකා අනතුරු සංඛ්‍යාව කොපමණද;

(ii) එම අනතුරු හේතුවෙන් ශ්‍රී ලංකාවේ සාගර කලාපයට සිදුවූ හානිය තක්සේරු කර තිබේද;

(iii) එසේ නම්, ඒ පිළිබඳ විස්තර කවරේද;

(iv) එම අනතුරු හේතුවෙන් සිදුවූ හානි සඳහා සාගරය පදනම් කරගෙන ජීවිකාව කරගත් පුද්ගලයන්ට වන්දි ලබාදී තිබේද;

(v) එසේ නම්, ඒ පිළිබඳ විස්තර කවරේද;

(vi) ශ්‍රී ලංකාවේ සමුද්‍රීය පරිසර පද්ධතිය ආරක්ෂා කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1368/2025

ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා,— ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අම්පාර දිස්ත්‍රික්කයේ, කල්මුනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි කිට්ටංගි පාලම ගංවතුර තත්ත්වයන්හිදී ජලයෙන් යට වන බැවින්, නාවිදන්වෙලි, මධ්‍යම කඳවුර, නට්පිට්ටිමුනෙ සහ සේනෙක්කුඩියිරුප්පු ප්‍රදේශවල ජීවත් වන දහස් සංඛ්‍යාත ජනතාවගේ ගමනාගමනයට බාධා ඇති වන අතර ජීවනෝපායන්ට බලපෑම් එල්ල වන බව දන්නේද;

(ii) එසේ නම්, කිට්ටංගි පාලම ගංවතුර තත්ත්වයන්ට ඔරොත්තු දෙන ආකාරයෙන් ඉදිකිරීම සඳහා මේ දක්වා ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1535/2025

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා,— ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දුම්රිය දෙපාර්තමේන්තුව යටතේ ඇති දුම්රිය ධාවනාගාර සංඛ්‍යාව කොපමණද;

(ii) එම දුම්රිය ධාවනාගාරවල නම් කවරේද;

(iii) එම එක් එක් දුම්රිය ධාවනාගාරය මඟින් ධාවනය කරන දුම්රිය සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම ධාවනාගාරවල පවතින පුරප්පාඩු සංඛ්‍යාව එක් එක් තනතුර අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ධාවනාගාරවල පවතින භෞතික, මානව සහ යටිතල පහසුකම් සම්බන්ධ අඩුපාඩු කවරේද;

(vi) දුම්රිය සේවාව ප්‍රශස්ත මට්ටමකට පත් කිරීම සඳහා දුම්රිය ධාවනාගාරවල පවතින අඩුපාඩු විසඳීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

(2026 නොවැම්බර් 23 සඳුදා)

2528/2026

ගරු රවී කරුණානායක මහතා,— කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගමේ පැල්වත්ත හා සෙවණගල ඒකක මඟින් 2020 වර්ෂයේ සිට 2024 සැප්තැම්බර් 23 දක්වා සහ 2024 සැප්තැම්බර් 24 සිට මේ දක්වා නිෂ්පාදනය කළ දුඹුරු සීනි හා සුදු සීනිවලින් එක් එක් ඒකකයක ප්‍රමාණය, ආදායම, ලාභය/අලාභය, කිලෝග්‍රෑම් එකක නිෂ්පාදන පිරිවැය, අලෙවි කළ ප්‍රමාණය සහ අලෙවි නොකළ ප්‍රමාණය, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම කාලසීමාවන් සඳහා සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගමේ වාර්ෂික ලාභය/අලාභය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) 2024 සැප්තැම්බර් මාසයට පෙර පැවති සහ ඉන් පසුව විවෘත කරන ලද සමාගමට අයත් අලෙවිසැල් සංඛ්‍යාව, ඒවා පිහිටි ස්ථාන, ආදායම සහ ලාභය/අලාභයද සමඟින්, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) 2024 සැප්තැම්බර් මාසයේ සිට නිෂ්පාදන ධාරිතාව, සීනි නිස්සාරණ අනුපාතය, වගා කරන ලද බීම් ප්‍රමාණය සහ මිලදී ගන්නා ලද උක් ප්‍රමාණය වැඩිවී හෝ අඩුවී තිබේද;

(v) පැල්වත්ත සහ සෙවණගල ඒකක නැවත ලාභදායී නිෂ්පාදන මට්ටමකට ගෙන ඒම සහ ශ්‍රී ලංකාව ආනයනික සීනි මත යැපීම අවම කිරීම සඳහා ගෙන ඇති පියවර සහ ඉලක්ක කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2026 නොවැම්බර් 25 බදාදා

වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1194/2025

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) යාපනය දිස්ත්‍රික්කයේ, ඩෙල්ෆ්ට් දූපතේ ප්‍රධාන ප්‍රවාහන මාධ්‍යය මුහුදු මාර්ගය බව දන්නේද;

(ii) එහි මගී ප්‍රවාහන සේවයේ යොදවා ඇති 'නෙඩුන්තාරහෙ මගී බෝට්ටුවේ' සේවය කරන සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම සේවකයන් දරන තනතුරු කවරේද;

(iv) එම සේවකයන් පත් කර සිටින පදනම සහ පත් කරන ලද දින වකවානු, තනතුර අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) එම සේවකයන්ට කොන්ත්‍රාත් පදනම මත පත්වීම් ලබාදී තිබෙන්නේ කවුරුන් විසින්ද;

(vi) විලියම් යේසුදාසන් ඇන්තනිරාජ් මහතා, සින්දාකුලම් මෙල්කියාස්මිලන් මහතා, ඇල්බට් මරියදාසන් මහතා, ඇන්තනි අමලදාස් මහතා සහ ඇන්රූස් රකීම්ලයෝන් මහතා යන අයගේ අධ්‍යාපන, වෘත්තීය සුදුසුකම් සහ සේවා කාලය සැලකිල්ලට ගෙන ඔවුන්ට ස්ථිර පත්වීම් ලබා දීමට කටයුතු කරන්නේද;

(vii) එසේ නම්, ස්ථිර පත්වීම් ලබා දෙන දිනය කවරේද;

(viii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1646/2025

ගරු තුරෙරාසා රවිකරන් මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මුලතිව්, මන්නාරම සහ වවුනියාව දිස්ත්‍රික්කවල සමස්ත භූමි ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) 2009 වර්ෂයට පෙර සහ මේ වනවිට එම දිස්ත්‍රික්කවල වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සහ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව යටතේ පවතින භූමි ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම දිස්ත්‍රික්කවල යුද හමුදාව, නාවික හමුදාව, ගුවන් හමුදාව සහ පොලිසිය යටතේ පවතින භූමි ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1683/2025

ගරු ඉම්රාන් මහරූෆ් මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) (i) කින්නියා මධ්‍ය විද්‍යාලයේ පිහිටි අබ්දුල් මජීඩ් ශාලාව සහ අල්-අක්සා විද්‍යාලයේ පිහිටි එම්.ඊ.එච්. මහරූෆ් ශ්‍රවණාගාරය ඉදිකරනු ලැබූ දිනයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) කින්නියා මධ්‍ය විද්‍යාලයේ පිහිටි අබ්දුල් මජීඩ් ශාලාව ඉදිකිරීමෙන් පසුව ඉදිකරන ලද අල්-අක්සා විද්‍යාලයේ පිහිටි එම්.ඊ.එච්. මහරූෆ් ශ්‍රවණාගාරය කඩා ඉවත් කර ඇති බව දන්නේද;

(iii) එසේ නම්, එම ගොඩනැගිල්ල කඩා ඉවත් කළ දිනය කවරේද;

(iv) එම ගොඩනැගිල්ල නිසි අනුමැතියක් යටතේ කඩා ඉවත් කර තිබේද;

(v) එසේ නම්, ඒ සඳහා අනුමැතිය දුන් පුද්ගලයින් කවුරුන්ද;

(vi) එම ගොඩනැගිල්ල කඩා ඉවත් කිරීම සම්බන්ධයෙන්, අදාළ අධ්‍යාපන කලාපයේ ගොඩනැගිලි භාර ඉංජිනේරුවරයා හෝ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා දැනුම්වත්වී නොසිටි බව දන්නේද;

(vii) භාවිතයට යෝග්‍ය ගොඩනැගිල්ලක් කඩා ඉවත් කිරීමට අනුමැතිය ලබාදුන් නිලධාරීන්ට එරෙහිව පියවර ගන්නේද;

(viii) එම ගොඩනැගිල්ල කඩා ඉවත් කිරීමෙන් පසුව, මේ වනවිට එම විද්‍යාලයට ශ්‍රවණාගාරයක් නොමැති වීම හේතුවෙන් සිසුන් දුෂ්කරතාවන්ට පත්ව සිටින බව දන්නේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1837/2026

ගරු වානක මාදුගොඩ මහතා,— ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මේ වනවිට ඇති ධීවර වරායන් සංඛ්‍යාව කොපමණද;

(ii) ධීවර තොටුපළවල් ධීවර වරායන් ලෙස ස්ථාපිත කළ දින සහ එම කාලසීමාවල ධීවර විෂයභාර අමාත්‍යවරයන් ලෙස කටයුතු කරන ලද අමාත්‍යවරුන්ගේ නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) වැඩිම තොටුපළවල් ප්‍රමාණයක් ධීවර වරායන් ලෙස සංවර්ධනය කළ කාල සීමාව කවරේද;

(iv) තොටුපළක් ධීවර වරායක් ලෙස ස්ථාපිත කිරීමේදී සිදු කරනු ලබන සංවර්ධන කටයුතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1964/2026

ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ වෛද්‍ය පුනරුත්ථාපන රෝහල් සහ ඒ සම්බන්ධ ඒකක තිබේද;

(ii) එසේ නම්, ඒවා පිහිටා ඇති ප්‍රදේශ කවරේද;

(iii) එම රෝහල් සහ ඒකක සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම රෝහල් සහ ඒකක සඳහා වාර්ෂිකව වෙන් කරන ප්‍රතිපාදන ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත රෝහල්වල උපරිම සේවාවක් සැපයීම සඳහා මේ වනවිට සේවයේ නියුතු කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් වන්නේද;

(ii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

(iii) පවතින කාර්ය මණ්ඩල පුරප්පාඩු පිරවීම සඳහා පියවර ගනු ලබන්නේද;

(iv) එසේ නම්, එම පුරප්පාඩු පිරවීමට අපේක්ෂිත දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත සඳහන් ඒකක වල කෘත්‍රිම අවයව නිෂ්පාදනය, රෝද පුටු නිෂ්පාදනය සහ අලුත්වැඩියා කටයුතු සිදු කිරීම සඳහා පහසුකම් තිබේද;

(ii) එසේ නම්, එම කාර්යයන් සඳහා විශේෂ ප්‍රතිපාදන වෙන් කිරීමක් සිදු කරන්නේද;

(iii) එසේ නම්, එම ප්‍රමාණය කොපමණද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

(2026 නොවැම්බර් 25 බදාදා)

2529/2026

ගරු රවී කරුණානායක මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට, — (1)

(අ) (i) 2022 ආහාර (ලේබල් කිරීම සහ ප්‍රචාරණය) රෙගුලාසි (අංක 2319/40 දරන ගැසට් පත්‍රය) 2024 ජනවාරි මාසයේ සිට ක්‍රියාත්මක කිරීම කල් දැමීමට, සංශෝධනය කිරීමට සහ 2026 ජූනි මාසයේදී අංක 2494/47 දරන ගැසට් පත්‍රය මඟින් ප්‍රතිස්ථාපනය කිරීමට බලපෑ තාක්ෂණික, නීතිමය හා පරිපාලනමය හේතු සහ ඒවායේ දේශීය කර්මාන්ත, වෙළෙඳාම හා පාරිභෝගිකයන් කෙරෙහි බලපෑම කවරේද;

(ii) 2024 සහ 2025 වර්ෂවල ආහාර ලේබල් කිරීම හා ප්‍රචාරණය සම්බන්ධ උල්ලංඝනයන් සඳහා පැවරූ නඩු සංඛ්‍යාව වර්ෂය හා දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2022 රෙගුලාසිවල පාරිභෝගික ආරක්ෂණ හා ප්‍රචාරණ ආරක්ෂණ විධිවිධාන 2026 රෙගුලාසි මඟින් ඉවත් කර/දුර්වල කර තිබේද;

(ii) එසේ නම්, ඊට හේතු කවරේද;

(iii) රෙගුලාසි කෙටුම්පත් කිරීම, ගැසට් කිරීම හා සංශෝධනය සඳහා වැයවූ මුළු මුදල කොපමණද;

(iv) ආහාර පනතේ 32(2) වගන්තිය යටතේ එම රෙගුලාසි පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ දින කවරේද;

(v) මෙවැනි රෙගුලාසි නැවත නැවතත් කල් දැමීම, සංශෝධනය කිරීම හා අවලංගු කිරීම වැළැක්වීමට ගෙන ඇති පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2026 නොවැම්බර් 26 බ්‍රහස්පතින්දා

වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1913/2026

ගරු බී. ආරියවංශ මහතා,— වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ වාර්ෂික පොල් තෙල් නිෂ්පාදන ප්‍රමාණය වර්ෂ අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම කාලය තුළ පොල් තෙල් අපනයනය කර තිබේ නම්, එහි ප්‍රමාණය සහ එමඟින් උපයා ඇති ආදායම වර්ෂ අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම කාල සීමාව තුළ පොල් තෙල් ආනයනය කර තිබේ නම්, එහි ප්‍රමාණය සහ ඒ සඳහා වැය කරන ලද මුදල් ප්‍රමාණය වර්ෂ අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) පොල් තෙල්වල ප්‍රමිතිය තහවුරු කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2200/2026

ගරු ජේ.සී. අලවතුවල මහතා,— විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට විදේශ තානාපති කාර්යාලවල කම්කරු සුබසාධන නිලධාරීන් ලෙස සේවය කරන නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිලධාරීන්ගේ නම් සහ ඔවුන් සේවය කරන ස්ථානය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම නිලධාරීන්ට පැවරී ඇති කාර්යභාරය කවරේද;

(iv) එම නිලධාරීන් බඳවාගැනීමේ ක්‍රමවේදය කවරේද;

(v) එම බඳවාගැනීම් කුසලතා මත සිදු කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2290/2026

ගරු අබූබකර් අතම්බාවා මහතා,— වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) සායින්දමරුදු විවිධ සේවා සමුපකාර සමිතියේ පසුගිය කාලය තුළ සිදුවූයේ යැයි පැවසෙන මහා පරිමාණ දූෂණ හා අක්‍රමිකතා හේතුවෙන් සමිතිය කෙරෙහි ජනතා විශ්වාසය බිඳ වැටී ඇති බවත්;

(ii) ගොඩනැගිලි අඩු මුදලකට බදු දීම, ඇතැම් බදුකරුවන් විසින් ඒවා අතුරු බදු දීම සහ දීර්ඝ කාලයක් මුළුල්ලේ හිඟ බදු අයකරගෙන නොමැති වීම වැනි අක්‍රමිකතා සිදුවී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සමිතියේ ශාඛා සංඛ්‍යාව, පසුගිය නිලවරණය පැවැත්වූ දිනය සහ වර්තමාන කටයුතු කවරේද;

(ii) පසුගිය නිලවරණය දක්වා අතුරු සභාවක් මඟින් පරිපාලනය කළ කාලසීමාව කොපමණද;

(iii) ඡන්ද නාමලේඛනයේ අක්‍රමිකතා, බහුතර සාමාජිකයන් වයෝවෘද්ධ පුද්ගලයන් වීම, නව සාමාජිකයන් බඳවා ගැනීම නිශ්චිත පිරිසකට සීමා වීම සහ සමිතියේ සමාජ දායකත්වය පිළිබඳ තරුණ ප්‍රජාව දැනුම්වත් නොවීම සම්බන්ධයෙන් ගැටලු ඇති බව පිළිගන්නේද;

(iv) දූෂණ හා අක්‍රමිකතා හේතුවෙන් සිදුවූ අලාභ අයකර ගැනීම සහ සමිතියේ පරිපාලන අක්‍රමිකතා නිවැරදි කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2291/2026

ගරු සුනිල් රාජපක්ෂ මහතා,— වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පෞද්ගලික වැවිලි සමාගම් සහ රාජ්‍ය වැවිලි සමාගම්වලට අයත් වතු නිවාසවල ජීවත්වන ජනතාවට කම්කරු රැකියාවට අමතරව ස්වයං රැකියාවක හෝ ව්‍යාපාර කටයුත්තක නිරත වීමේ හැකියාව තිබේද;

(ii) එසේ නම්, ඔවුන්ගේ නමින් ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ හැකියාව පවතින්නේද;

(iii) ව්‍යාපාර ලියාපදිංචි කිරීමේදී ව්‍යාපාර ස්ථානයේ අයිතිය තහවුරු කිරීම සඳහා පවතින ප්‍රතිපාදන කවරේද;

(iv) ප්‍රජා ශක්ති හෝ සමෘද්ධි සවිබල ගැන්වීමේ වැඩසටහන් සඳහා තෝරාගනු ලබන වතු නිවාසවල ජීවත්වන ජනතාවට කෘෂිකාර්මික හෝ සත්ත්ව පාලන කටයුතුවල නිරත වීම සඳහා ප්‍රයෝජනයට නොගන්නා වතු ඉඩම් ලබාදීමේ වැඩපිළිවෙළක් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2571/2026

ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා,— බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කෝවිල් ලියාපදිංචි කිරීමේදී ඉඩම් අයිතිය තහවුරු කිරීම අවශ්‍ය බවත්;

(ii) වතු ප්‍රදේශවල පිහිටි කෝවිල් ලියාපදිංචි කිරීමේදී වතු පරිපාලනයේ අනුමැතිය ඉල්ලා සිටින අතර ඇතැම් අවස්ථාවල එම නිර්දේශය ලබා නොදීම හේතුවෙන් කෝවිල් ලියාපදිංචි කිරීමට නොහැකිවී ඇති බවත්;

(iii) ග්‍රාම නිලධාරින් විසින්ද වතු ආශ්‍රිත කෝවිල් ලියාපදිංචි කිරීමේදී ඉඩම් නිරවුල් පිළිබඳ නිර්දේශය ලබා නොදෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මෙම ගැටලු නිරාකරණය කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

(2026 නොවැම්බර් 26 බ්‍රහස්පතින්දා)

2560/2026

ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා,— වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාතික ජන බලවේග රජයේ 'පොහොසත් රටක්-ලස්සන ජීවිතයක්' ප්‍රතිපත්ති ප්‍රකාශයේ 107 වැනි පිටුවෙහි සඳහන් 'මහා පරිමාණ ආර්ථික හා හුවමාරු මධ්‍යස්ථාන දිස්ත්‍රික්ක මට්ටමෙන් ස්ථාපිත කිරීම' යන යෝජනාව, 2026.09.01 දිනය වනවිට ඉටුකර තිබේද;

(ii) එසේ නම්, එහි මූල්‍ය/භෞතික ප්‍රගතිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2026 නොවැම්බර් 27 සිකුරාදා

වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2179/2026

ගරු නීතිඥ සරත් කුමාර මහතා,— මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ මේ වනවිට සේවයේ නියුතු සිවිල් ආරක්ෂක භටයින් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ පත්වීම් ස්ථිර කර තිබේද;

(iii) එම භටයින් සේවයේ නියුතු කඳවුරු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම භටයින් තාවකාලික සේවා ස්ථාන වෙත අනුයුක්ත කර තිබේද;

(ii) එසේ නම්, ඔවුන්ගේ මූලික අවශ්‍යතා සපුරාලීම සඳහා වැඩපිළිවෙළක් සකස් කර තිබේද;

(iii) එම භටයින් සඳහා නිශ්චිත සේවා ස්ථාන ලබා දීමේ හැකියාවක් තිබේද;

(iv) සිවිල් ආරක්ෂක භටයින්ට ස්ථාන මාරු ලබාදීමේදී අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2209/2026

ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා,— විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය යටතේ ලියාපදිංචිවී ඇති විදේශ රැකියා නියෝජිතායතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් නියෝජිතායතනයෙහි නම සහ ලිපිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) 2015 වර්ෂයේ සිට මේ දක්වා අසාදු ලේඛනගත කර ඇති නියෝජිතායතන සංඛ්‍යාව සහ ඒවායේ නම් කවරේද;

(iv) විදේශ රැකියා නියෝජිතායතන නියාමනය කිරීම සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2515/2026

ගරු දේවානන්ද සුරවීර මහතා,— කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 'සුළු ව්‍යාපාර සංවර්ධන ණය යෝජනා ක්‍රමය' යටතේ 2025 වර්ෂයේදී ලබා දුන් මුළු ණය ප්‍රමාණය සහ ප්‍රතිලාභීන් සංඛ්‍යාව කොපමණද;

(ii) මේ ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ ක්‍රියාවලිය සිදු කරන ආයතනය කවරේද;

(iii) බැංකු ණය මත සුළු ව්‍යාපාර ආරම්භ කර පවත්වාගෙන යන ලදුව, 'කොවිඩ්-19' සහ 'දිට්වා' වැනි ස්වාභාවික විපත් හේතුවෙන් ව්‍යාපාර අඩපණවූ ව්‍යාපාරිකයන් නඟාසිටුවීම සඳහා මේ යටතේ ණය ආධාර ලබා දීමේ වැඩපිළිවෙළක් තිබේද;

(iv) එසේ නම්, එහි ප්‍රතිලාභීන් සංඛ්‍යාව කොපමණද;

(v) සුදුස්සන් අභිබවා නුසුදුස්සන්ට ණය ලබා දෙන බවට පවතින චෝදනා පිළිබඳව විමර්ශනයක් සිදු කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ දක්වා ණය ලබාගෙන ඇති ප්‍රතිලාභී සුළු ව්‍යාපාරවල රැකියා උත්පාදනය හා ආදායම් වර්ධනය පිළිබඳව ඇගයීමක් සිදු කර තිබේද;

(ii) එසේ නම්, එම ඇගයීම් ක්‍රමවේදය කවරේද;

(iii) ඉදිරියේදී ණය යෝජනා ක්‍රමය වැඩිදියුණු කිරීම සඳහා පොළී අනුපාත, ඇපකර සහ තාක්ෂණික පුහුණු වැඩසටහන් සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය වෙනස්කම් සිදු කිරීමට අපේක්ෂා කරන්නේද;

(iv) එසේ නම්, එම වෙනස්කම් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2517/2026

ගරු සුරංග රත්නායක මහතා,— මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පොලිස් ස්ථානාධිපතිවරුන් සඳහා වෙන්කර ඇති නිල නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) සෑම පොලිස් ස්ථානයකම නිල නිවාස පහසුකම් තිබේද;

(iii) නොඑසේ නම්, නිල නිවාස පහසුකම් නොමැති පොලිස් ස්ථාන සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නිල නිවාස නොමැති පොලිස් ස්ථාන සඳහා නිල නිවාස ඉදිකිරීම හෝ ලබාදීම සඳහා ඇස්තමේන්තුගත වියදම කොපමණද;

(ii) මේ වනවිට ඉදිකරමින් පවතින නිල නිවාස සංඛ්‍යාව කොපමණද;

(iii) එම නිල නිවාස පිහිටා ඇති පොලිස් ස්ථාන කවරේද;

(iv) පොලිස් නිලධාරීන්ගේ හා මහජනතාවගේ ශ්‍රම දායකත්වයෙන් නිල නිවාස ඉදිකරන අවස්ථා තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) නිල නිවාස නොමැති වීම හේතුවෙන් පෞද්ගලික නිවාස කුලී පදනම මත ලබාගෙන තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා වාර්ෂිකව වැය කරනු ලබන මුදල කොපමණද;

(iii) අවශ්‍ය නිල නිවාස පහසුකම් සම්පූර්ණයෙන් ලබාදීම සඳහා විධිමත් වැඩපිළිවෙළක් සකස් කර තිබේද;

(iv) එසේ නම්, එය සම්පූර්ණ කිරීමට අපේක්ෂිත කාලසීමාව කවරේද;

යන්න එතුමා තවදුරටත් මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2565/2026

ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා,— අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මොනරාගල දිස්ත්‍රික්කය තුළ පවතින ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අයත් වන අධිකරණ කලාප සංඛ්‍යාව කොපමණද;

(ii) එම අධිකරණ කලාපවල නම් කවරේද;

(iii) මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ගල්ගමුව, නෙල්ලියද්ද, මුල්ලේගම සහ ඉඹිනියාගල යන ග්‍රාම නිලධාරී කොට්ඨාස අයත් වන අධිකරණ කලාප කවරේද;

(iv) එම අධිකරණ කලාප නිල වශයෙන් ගැසට් මඟින් ප්‍රකාශයට පත් කර තිබේ නම්, එම ගැසට් නිවේදන කවරේද;

(v) එම අධිකරණ කලාප මේ දක්වා ගැසට් මඟින් ප්‍රකාශයට පත් කර නොමැති නම්, ඒ සම්බන්ධයෙන් ජනතාව මුහුණ දෙන අපහසුතා මහහරවා ගැනීම සඳහා ගනු ලබන කඩිනම් පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

(2026 නොවැම්බර් 27 සිකුරාදා)

2561/2026

ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා,— මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාතික ජන බලවේග රජයේ 'පොහොසත් රටක්-ලස්සන ජීවිතයක්' ප්‍රතිපත්ති ප්‍රකාශයේ 120 වැනි පිටුවෙහි සඳහන් 'සාධාරණ මිලකට බිත්තර හා කුකුළු මස් ලබාදීම සඳහා සත්ත්ව ආහාර ඇතුළු අනෙකුත් නිෂ්පාදන අමුද්‍රව්‍ය සඳහා බදු සහන' යන යෝජනාව, 2026.09.01 දින වනවිට ඉටුකර තිබේද;

(ii) එසේ නම්, එහි මූල්‍ය/භෞතික ප්‍රගතිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2026 නොවැම්බර් 28 සෙනසුරාදා

වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

36/2024

ගරු නීතිඥ හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා අරමුදල නමින් අරමුදලක් තිබේද;

(ii) එසේ නම්, මේ වනවිට එම අරමුදල සතු වත්කම් ප්‍රමාණය කොපමණද;

(iii) අරමුදලේ මුදල් යොදවා කාබනික පොහොර නිෂ්පාදනය කිරීමේ වැඩසටහනක් ආරම්භ කර තිබේද;

(iv) එසේ නම්, ඒ පිළිබඳ විස්තර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

167/2024

ගරු චමින්ද විජේසිරි මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ මේ වනවිට ක්‍රියාත්මක වන රාජ්‍ය දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල සහ අනෙකුත් ව්‍යවස්ථාපිත ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ආයතනවල නම් කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම ආයතන අතරින් පෞද්ගලික ගොඩනැගිලිවල පවත්වාගෙන යනු ලබන ආයතන කවරේද;

(ii) 2015 වර්ෂයේ සිට මේ දක්වා එම ආයතන සඳහා කුලී සහ අනෙකුත් ගොඩනැගිලි භාවිත ගාස්තු වශයෙන් ගෙවා ඇති සම්පූර්ණ මුදල කොපමණද;

(iii) මෙම ආයතන රජය සතු ගොඩනැගිලිවල ස්ථානගත කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2377/2026

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි හෝටල්, සංචාරක නවාතැන් සහ ආගන්තුක නිවාසවලින් පළාත් පාලන ආයතන විසින් අය කරනු ලබන බදු, බලපත්‍ර ගාස්තු සහ අනෙකුත් ගාස්තු සම්බන්ධයෙන් පවතින නීතිමය ප්‍රතිපාදන කවරේද;

(ii) එම ගෙවීම් පැහැර හරින ආයතනවලට එරෙහිව පළාත් පාලන ආයතන විසින් ගත හැකි නීතිමය ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ පසුගිය වර්ෂ 05 තුළ සංචාරක නවාතැන්වලින් අය විය යුතු, අය කරගත් සහ හිඟ බදු මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) බදු ගෙවීම පැහැර හැරීමෙන් ආදායම අඩුවී ඇති තත්ත්වයක් තුළ සේවක වැටුප් සඳහා වන 40%ක වියදම පියවා ගන්නා ආකාරය කවරේද;

(iii) බදු අය කිරීමේ අඩුපාඩු හේතුවෙන් සේවක වැටුප් හා අත්‍යවශ්‍ය සේවාවන්ට බලපෑමක් ඇති නොවීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(iv) හිඟ බදු කඩිනමින් අය කර ගැනීමටත්, මූල්‍ය ස්ථාවරභාවය පවත්වා ගැනීමටත් විශේෂ බදු අය කිරීමේ යාන්ත්‍රණයක් හඳුන්වා දෙන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2546/2026

ගරු නිශාන්ත පෙරේරා මහතා,— නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පිටකොටුව, ගුණසිංහ ප්‍රතිමාව අසල මිහිදු මාවතෙහි ජාතික නිවාස සංවර්ධන අධිකාරියට අයත් වෙළඳ හා නිවාස සංකීර්ණයක් පිහිටා තිබේද;

(ii) එසේ නම්, එම වෙළඳ හා නිවාස සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කළ සහ අවසන් කළ වර්ෂ කවරේද;

(iii) ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමෙන් පසුව එහි නිවාස හා වෙළඳසැල් ජනතාවට ලබාදී තිබේද;

(iv) එසේ නම්, ඒ සඳහා අනුගමනය කරන ලද ක්‍රමවේදය කවරේද;

(v) එලෙස ලබාදී ඇති නිවාස හා වෙළඳසැල්වල වත්මන් තත්ත්වය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2566/2026

ගරු පද්මසිරි බණ්ඩාර මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මේ වනවිට ක්‍රියාත්මක වන හෙද විදුහල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම හෙද විදුහල්වල මේ වනවිට පුහුණුව ලබන හෙද ශිෂ්‍යයන් සංඛ්‍යාව කොපමණද;

(iii) 2026 වර්ෂය සඳහා ශ්‍රී ලංකාවේ රෝහල් සඳහා අවශ්‍ය හෙද නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(iv) මේ වනවිට පවතින හෙද නිලධාරි පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(v) හෙද විදුහල් විශ්වවිද්‍යාල මට්ටමට උසස් කර හෙද නිලධාරීන් බඳවාගැනීම සම්බන්ධයෙන් ක්‍රියාත්මක වැඩපිළිවෙළෙහි වත්මන් තත්ත්වය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

(2026 නොවැම්බර් 28 සෙනසුරාදා)

2567/2026

ගරු සුසන්ත කුමාර නවරත්න මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් 2026 අයවැය ප්‍රතිපාදන යටතේ ප්‍රතිසංස්කරණය හෝ අලුත්වැඩියා කිරීම සිදු කරනු ලබන වැව් සංඛ්‍යාව, එක් එක් ආයතනය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන විදේශාධාර හෝ විදේශ ණය ව්‍යාපෘති සහ එම එක් එක් ව්‍යාපෘතිය සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණය ඇමෙරිකානු ඩොලර්වලින් වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් ව්‍යාපෘති අතරින් වැව්, අමුණු සහ ඇළ මාර්ග ප්‍රතිසංස්කරණය, අලුත්වැඩියා කිරීම හෝ අලුතින් ඉදිකිරීම සිදු කරනු ලබන ව්‍යාපෘති කවරේද;

(ii) එම එක් එක් ව්‍යාපෘතිය යටතේ 2026 වර්ෂයේදී ප්‍රතිසංස්කරණය, අලුත්වැඩියා කිරීම හෝ අලුතින් ඉදිකිරීම සිදු කරනු ලබන වැව්, අමුණු සහ වාරි ඇළ මාර්ග සංඛ්‍යාව කොපමණද;

(iii) එම එක් එක් ව්‍යාපෘතිය යටතේ 2026 වර්ෂය සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2026 නොවැම්බර් 30 සඳුදා

වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

690/2025

ගරු රෝහණ බංඩාර මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) උතුරු මැද පළාතේ, සියඹලෑව, නැගම්පහ උමැ/අනු/තඹු/ගල්/නෙළුම්පත්ගම විද්‍යාලය නමින් පාසලක් තිබෙන බව දන්නේද;

(ii) එම පාසලේ මේ වනවිට ඉගෙනුම ලබන ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද;

(iii) එම පාසලේ සේවය කරන ගුරුවරුන් සංඛ්‍යාව කොපමණද;

(iv) මෙම පාසල සංවර්ධනය කිරීමට සහ අඛණ්ඩව පවත්වාගෙන යාමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

991/2025

ගරු කිංස් නෙල්සන් මහතා,— කම්කරු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකයින් සඳහා ප්‍රතිලාභ නිසි පරිදි ලබා නොදුන් බව අනාවරණයවී ඇති රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ආයතනවල නම් කවරේද;

(iii) අදාළ සාමාජිකයින්ට නිසි ප්‍රතිලාභ ලබාදීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(iv) ඉහත (i)හි සඳහන් කාලය තුළ අර්ථසාධක ගිණුම්වලට දායක මුදල් නිසි පරිදි බැර නොකළ රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ ආයතනවලට එරෙහිව ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1745/2025

ගරු චාමර සම්පත් දසනායක මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උමා ඔය ජලවිදුලි බලාගාරයේ ඉදිකිරීම් කටයුතු මේ වනවිට අවසන් කර, එහි ජනන ධාරිතාව ජාතික විදුලිබල පද්ධතියට එක් කර තිබේද;

(ii) එසේ නම්, එමඟින් මේ වනවිට මෙරට විදුලිබල පද්ධතියට එක්වී ඇති විදුලි ධාරිතාව කොපමණද;

(iii) ඉරාන රජය විසින් මෙම ව්‍යාපෘතිය සඳහා ලබාදී ඇති අරමුදල් ප්‍රමාණය කොපමණද;

(iv) එම අරමුදල් ලබාදී ඇත්තේ ආධාරයක් ලෙසද, නොඑසේ නම්, ණය මුදලක් ලෙසද;

(v) මෙම ව්‍යාපෘතියේ උමං මාර්ග ඉදිකිරීම හේතුවෙන් සිදුවූ හානි සඳහා අදාළ පුද්ගලයන්ට වන්දි ගෙවීම අවසන් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2459/2026

ගරු ධනුෂ්ක රංගනාත් මහතා,— ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සතු මුළු බස් රථ සංඛ්‍යාව කොපමණද;

(ii) මේ වනවිට ධාවන තත්ත්වයේ පවතින බස් රථ සංඛ්‍යාව කොපමණද;

(iii) ධාවන තත්ත්වයේ නොමැති බස් රථ අතරින් නැවත ධාවන තත්ත්වයට පත් කළ හැකි බස් රථ සංඛ්‍යාව කොපමණද;

(iv) එම බස් රථ නැවත ධාවනයට එක් කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම මණ්ඩලය මඟින් දිනකට බස් රථ ධාවනය කිරීමට අපේක්ෂිත කිලෝමීටර් ප්‍රමාණය කොපමණද;

(ii) ඉන් දිනකට ධාවනය නොවන සාමාන්‍ය කිලෝමීටර් ප්‍රමාණය කොපමණද;

(iii) ඒ හේතුවෙන් දිනකට අහිමි වන ආදායම කොපමණද;

(iv) එලෙස අහිමි වන ධාවන දුර අවම කරගැනීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2509/2026

ගරු නීතිඥ හිරුනි විජේසිංහ මහත්මිය,— ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මේ වනවිට ක්‍රියාත්මක රියදුරු පුහුණු ආයතන සඳහා ජාතික මට්ටමේ පොදු හා විධිමත් විෂය නිර්දේශයක් සහ ක්‍රමවත් නියාමන රාමුවක් තිබේද;

(ii) නොඑසේ නම්, සියලුම රියදුරු පුහුණු ආයතනවල එකම ප්‍රමිතියකින් හා ගුණාත්මකභාවයකින් පුහුණුව ලබාදීම සඳහා නව විෂය නිර්දේශයක් සහ නියාමන වැඩපිළිවෙළක් සකස් කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වර්තමාන රියදුරු පුහුණු විෂය නිර්දේශයට වාහනයක ඇතිවිය හැකි සුළු තාක්ෂණික හා යාන්ත්‍රික දෝෂ හඳුනාගෙන නිරාකරණය කරගැනීම පිළිබඳ න්‍යායාත්මක සහ ප්‍රායෝගික පුහුණුව ඇතුළත් වන්නේද;

(ii) නොඑසේ නම්, එවැනි දෝෂ නිරාකරණය කර ගැනීම පිළිබඳ ප්‍රායෝගික පුහුණු මොඩියුලයක් රියදුරු බලපත්‍රය ලබාගැනීමේ මූලික පුහුණුවට ඇතුළත් කිරීමට පියවර ගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) මහාමාර්ග ආරක්ෂාව, රථවාහන නීති-රීති පිළිබඳ යාවත්කාලීන දැනුම, මාර්ග ආචාරධර්ම සහ ප්‍රථමාධාර පිළිබඳ මූලික දැනුමද මෙම රියදුරු පුහුණුව සඳහා ඇතුළත් කිරීමට යෝජනාවී තිබේද යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2026 දෙසැම්බර් 01 අඟහරුවාදා

වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

375/2025

ගරු අජිත් පී. පෙරේරා මහතා,— කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) දේශපාලන ව්‍යුහය තුළ කාන්තා නියෝජනය අවම වශයෙන් 50%ක් දක්වා ඉහළ නැංවිය යුතු බවත්;

(ii) පාර්ලිමේන්තුවේ ජාතික ලැයිස්තුවෙන් අවම වශයෙන් 50%ක් කාන්තාවන් සඳහා වෙන් කළ යුතු බවට වන යෝජනාවක් පවතින බවත්;

(iii) පාර්ලිමේන්තු මැතිවරණ සඳහා එක් එක් දිස්ත්‍රික්කයේ නාමයෝජනා ලැයිස්තුවෙන් 50%ක් කාන්තාවන් සඳහා වෙන් කළ යුතු බවට වන යෝජනාවක් පවතින බවත්;

එතුමිය පිළිගන්නෙහිද?

(ආ) එසේ නම්, එම ප්‍රතිපත්තිය සාක්ෂාත් කරගැනීම සඳහා ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත නීති ප්‍රතිසංස්කරණ කවරේද යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

480/2025

ගරු රවී කරුණානායක මහතා,— ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ සමාජ සුබසාධන ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා මේ දක්වා ලියාපදිංචිවී ඇති පවුල් සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) 2023 සහ 2024 වර්ෂයන්හිදී සමෘද්ධි වැඩසටහන යටතේ ප්‍රතිලාභ ලැබූ පවුල් සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) සමෘද්ධි වැඩසටහන යටතේ ප්‍රතිලාභ ලබා ගැනීමට සුදුසුකම් ලබන පවුල් හඳුනා ගැනීම සහ තෝරා ගැනීම සඳහා භාවිතා කරන ක්‍රමවේදය කවරේද;

(iv) ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ ක්‍රියාවලියේ සඵලතාවය පිළිබඳව යම් ඇගයීමක් සිදුකර තිබේද;

(v) සමෘද්ධි වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී වාර්ෂිකව දැරීමට සිදුවන මුළු පරිපාලන වියදම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

709/2025

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ පශු සම්පත් ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම සඳහා ඉන්දියාවේ සහාය ලබා ගැනීමේ වැඩසටහනක් පසුගිය රජය විසින් සැලසුම් කර තිබූ බව දන්නේද;

(ii) ඒ සම්බන්ධයෙන් වර්තමාන රජය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(iii) ශ්‍රී ලංකාවේ පශු සම්පත් ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

999/2025

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා,— කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සීනි කර්මාන්තශාලා තුළ සීනි නිෂ්පාදනයට අමතරව කරනු ලබන වෙනත් නිෂ්පාදන කවරේද;

(ii) 2023 වර්ෂයේ සිට මේ දක්වා එක් එක් කර්මාන්තශාලාවේ වාර්ෂික නිෂ්පාදන ප්‍රමාණය සීනි සහ අනෙකුත් නිෂ්පාදනද ඇතුළත්ව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම කාලසීමාව තුළ එක් එක් කර්මාන්තශාලාවේ වාර්ෂික ආදායම සහ වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ වනවිට පාඩු ලබන සීනි කර්මාන්තශාලා තිබේද;

(ii) එසේ නම්, එම කර්මාන්තශාලා කවරේද;

(iii) එම කර්මාන්තශාලාවල 2023 වර්ෂයේ සිට මේ දක්වා වාර්ෂික පාඩුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එලෙස පාඩු ලැබීමට හේතු කවරේද;

(v) එම කර්මාන්තශාලා ලාභ ලබන තත්ත්වයට පත් කිරීම සඳහා රජය ගෙන ඇති වැඩපිළිවෙළ කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1356/2025

ගරු (ආචාර්ය) එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලාහ් මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ කාත්තන්කුඩි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් පෙරියතෝනා ප්‍රදේශයේ අලුතින් ඉදි කළ යුතු සහ පිළිසකර කළ යුතු කාණු පද්ධති පවතින බව දන්නේද;

(ii) එරාවුර් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ලෙගූන් උද්‍යාන පාරේ අලුතින් ඉදිකළ යුතු හා පිළිසකර කළ යුතු කාණු පද්ධති පවතින බව දන්නේද;

(iii) එසේ නම්, ඒ සඳහා අවශ්‍ය පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2026 දෙසැම්බර් 02 බදාදා

වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1342/2025

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා,— කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලංකා පිහන් සංස්ථාව සතු කර්මාන්තශාලාවක් හලාවත මැතිවරණ කොට්ඨාසයේ බංගදෙණිය ප්‍රදේශයේ පිහිටා තිබෙන බව දන්නේද;

(ii) එම ඉඩමේ සමස්ත භූමි ප්‍රමාණය කොපමණද;

(iii) එහි පිහිටි ගොඩනැගිලි කඩා ඉවත් කර ඇති බව දන්නේද;

(iv) එම කර්මාන්තශාලාවෙන් සහ ඉඩමෙන් උපරිම ප්‍රයෝජන ලබා ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1383/2025

ගරු නීතිඥ චමින්ද්‍රාණී කිරිඇල්ල මහත්මිය,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2025 වර්ෂයේ මාතෘ සහ ළමා සෞඛ්‍ය කටයුතු සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය කොපමණද;

(ii) එම ප්‍රතිපාදනයෙන් මෙතෙක් භාවිතා කර ඇති ප්‍රතිපාදනය කොපමණද;

(iii) ඒ යටතේ ක්‍රියාත්මක කර ඇති වැඩසටහන් සහ ව්‍යාපෘති කවරේද;

(iv) භාවිතා කළ ප්‍රතිපාදනය, වෙන් කරන ලද මුළු ප්‍රතිපාදනයෙන් ප්‍රතිශතයක් ලෙස කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1703/2025

ගරු රෝහිණි කුමාරි විජේරත්න මහත්මිය,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මේ වනවිට ක්‍රියාත්මක වන ගුරු විද්‍යාල සංඛ්‍යාව කොපමණද;

(ii) එම විද්‍යාලවල නම් කවරේද;

(iii) මෙම විද්‍යාලවල පවත්වනු ලබන පාඨමාලා කවරේද;

(iv) නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට අනුව, ගුරු විද්‍යාලවල පාඨමාලා ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2009/2026

ගරු ලාල් ප්‍රේමනාත් මහතා,— වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මතුරට වැවිලි සමාගමට අයත් බෙවරලිය වතුයායේ සිදුවන ස්වාභාවික මරණ ලියාපදිංචි කිරීමේ වගකීම වර්තමාන වතු පාලනාධිකාරිය විසින් පැහැර හැරීම හේතුවෙන් එහි පදිංචි ජනතාව අසීරුතාවයට පත්ව ඇති බව දන්නේද;

(ii) 1951 අංක 17 දරන උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ පනත සහ අංක 08/2023 චක්‍රලේඛය අනුව, ලියාපදිංචි වතුයායක සිදුවන මරණයක් දැනුම්දීමේ නීත්‍යානුකූල බලය සහ වගකීම වතු පාලනාධිකාරිය සතු බව පිළිගන්නේද;

(iii) වතු රෝහලක් හෝ සුභසාධන නිලධාරියෙකු නොමැති බව පවසමින්, අනෙකුත් වතුවල ක්‍රියාත්මක වන මෙම පොදු ක්‍රියාවලිය බෙවරලිය වතුයායේ පමණක් අත්හිටුවීමට පාලනාධිකාරිය ගෙන ඇති තීරණයට එරෙහිව අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

(iv) එම වතු පාලනාධිකාරිය වෙත උපදෙස් ලබාදී, පීඩාවට පත් වතු ජනතාවට සහන සැලසීමට කටයුතු කරන්නේද;

(v) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2568/2026

ගරු සුසන්ත කුමාර නවරත්න මහතා,— නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උතුරු මැද පළාතේ, 'මහ ඇළ ජල ව්‍යාපෘතිය' යටතේ මේ වනවිට පානීය ජලය ලබාදී ඇති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කවරේද;

(ii) එම ව්‍යාපෘතිය යටතේ මේ වනවිට ජල සම්බන්ධතා ලබාදී ඇති පවුල් සංඛ්‍යාව කොපමණද;

(iii) ව්‍යාපෘතිය යටතේ මේ වනවිට ජල නළ එළා ඇති මාර්ගවල සමස්ත දිග කිලෝමීටර් කොපමණද;

(iv) තවදුරටත් ජල නළ එළීමට නියමිත මාර්ගවල දිග කිලෝමීටර් කොපමණද;

(v) එම ව්‍යාපෘතිය මඟින් ආවරණය කිරීමට අපේක්ෂිත මුළු පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

දින නියමයක් නොමැති යෝජනා පිළිබඳ දැනුම්දීම

පා.136/2026

ගරු තනුර දිසානායක මහතා
ගරු එම්.ඒ.සී.එස්. චතුරි ගංගානි මහත්මිය
ගරු ගයාන් ජනක මහතා
ගරු නීතිඥ සුනිල් වටගල මහතා
ගරු ගමගෙදර දිසානායක මහතා
ගරු ශාන්ත පද්ම කුමාර සුබසිංහ මහතා
ගරු ජනිත රුවන් කොඩිතුවක්කු මහතා
ගරු චමින්ද ලලිත් කුමාර මහතා
ගරු නීතිඥ අනුෂ්කා තිලකරත්න මහත්මිය
ගරු එරංග වීරරත්න මහතා
ගරු මුනීර් මුලාෆර් මහතා
ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා
ගරු ලසිත් භාෂණ ගමගේ මහතා
ගරු කිට්නන් සෙල්වරාජ් මහතා
ගරු චන්දන සූරියආරච්චි මහතා
ගරු (වෛද්‍ය) සඳරුවන් මදරසිංහ මහතා
ගරු ජගත් මනුවර්ණ මහතා
ගරු දීප්ති වාසලගේ මහත්මිය
ගරු කංචන වැලිපිටිය මහතා
ගරු ආර්.ජී. විජේරත්න මහතා
ගරු නීතිඥ නිලන්ති කොට්ටහච්චි මහත්මිය
ගරු මුහම්මද් ෆයිසාල් මහතා
ගරු සුනිල් බියන්විල මහතා
ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා
ගරු මංජුල සුගත් රත්නායක මහතා
ගරු අරුණ පනාගොඩ මහතා
ගරු නීතිඥ සුසන්ත දොඩාවත්ත මහතා
ගරු රොෂාන් අක්මීමන මහතා
ගරු නීතිඥ යූ.පී. අබේවික්‍රම මහතා
ගරු සුගත් තිලකරත්න මහතා
ගරු නන්ද බණ්ඩාර මහතා
ගරු වසන්ත පුෂ්ප කුමාර මහතා
ගරු අසෝක සපුමල් රන්වල මහතා

ගරු (වෛද්‍ය) නිහාල් අබේසිංහ මහතා

ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා

ගරු නිශාන්ත පෙරේරා මහතා

ගරු කේ. ඉලංකුමාරන් මහතා

ගරු ආනන්ද විජේපාල මහතා

ගරු (වෛද්‍ය) එස්. ශ්‍රී බවානන්දරාජා මහතා

ගරු කන්දසාමි ප්‍රභු මහතා

ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා

ගරු ෆස්මින් ෂරීෆ් මහතා

ගරු (වෛද්‍ය) සෙල්ලතම්බි තිලකනාදන් මහතා

ගරු නීතිඥ භාග්‍ය ශ්‍රී හේරත් මහතා

ගරු එරංග ගුණසේකර මහතා

ගරු ආර්.එම්. සමන්ත රණසිංහ මහතා

ගරු සංජීව රණසිංහ මහතා

ගරු රියාස් ෆාරූක් මහතා

ගරු සුදත් බලගල්ල මහතා

ගරු ඊ.එම්. බස්නායක මහතා

ගරු රජීවන් ජෙයවන්ද්‍රමූර්ති මහතා,— 1983 කළු ජූලි බේදනීය සිදුවීම හා එහි බලපෑම පිළිබඳව පූර්ණ අධ්‍යයනයක් සිදු කර වාර්තා කිරීමටත්, ජාතික සහජීවනය තහවුරු කිරීම සහ පීඩාවට පත් පිරිස් වෙත සහන සැලසීම පිළිබඳ සිය යෝජනා සහ නිර්දේශ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත් වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,— 1983 වසරේ දී සිදු වූ කළු ජූලිය හේතුවෙන් දශක කිහිපයක් තිස්සේ රටක් ලෙස ආර්ථික, සමාජීය, සංස්කෘතික වශයෙන් ආපස්සට ඇද දමන ලදුව, ඒ හේතුවෙන් වටිනා ජීවිත දහස් ගණනක් අහිමි වූ අතර දැවැන්ත දේපළ හානියක් ද සිදු වූ අතර ආර්ථික වශයෙන් ද දැවැන්ත පසුබෑමකට ලක් වූ හෙයින් ද;

එම භෞතික හානියට වඩා රටට සිදු වූ බරපතලම සහ විනාශකාරී හානිය වන්නේ ජන කොටස් අතර නොසන්සුන්තාවය, බිය හා සැකය වර්ධනය වීම හෙයින් ද;

ශ්‍රී ලංකා ඉතිහාසයේ දරුණුතම බේදවාචකයක් ලෙස සැලකෙන 1983 කළු ජූලි සිදුවීමෙන් සිදු වූ ජීවිත හානි, දේපළ හානි හා ජනතාවට සිදුව ඇති මානසික හා සාමාජීය හානිය මෙතෙක් නිසි ලෙස තක්සේරු කර නොමැති හෙයින් ද;

මෙවැනි ජාතිවාදී හා අර්බුදකාරී සිදුවීම් අනාගතයේ දී නැවත සිදුවීම වළක්වා ගැනීම සඳහා ශක්තිමත් නීතිමය, සාමාජීය හා සංහිඳියා යාන්ත්‍රණයක් සකස් කිරීමේ අවශ්‍යතාව මතු වී ඇති හෙයින් ද;

ශ්‍රී ලංකාව තුළ විවිධ ජාතීන් අතර පවතින විශ්වාසය සහ සුහදතාවය බිඳ වැටෙන ආකාරයේ ක්‍රියාකාරකම් වළක්වා ගැනීම සඳහා අවශ්‍ය පියවර ගැනීම අත්‍යවශ්‍ය කරුණක් බවට පත්ව තිබෙන හෙයින් ද;

එම සිදුවීම් සඳහා හේතු සාධක වූ කරුණු සහ එම විනාශකාරී ක්‍රියාවන් මෙහෙය වූ පුද්ගලයින් ආනාවරණය කරගත යුතු හෙයින් ද;

එම සිදුවීමෙන් පීඩාවට පත් සහ අගතියට පත් වූ සමස්ත ජනතාවගේ සිත් පැදීම උදෙසා සහ ඔවුන් වෙත යම් කිසි සාධාරණ සහනයක් හෝ ගෞරවනීය සුවපත් කිරීමේ පියවර ලබාදීම රාජ්‍යයක වගකීමක් වන හෙයින් ද;

1983 කළු ජූලි ඛේදනීය සිදුවීම හා එහි බලපෑම පිළිබඳව පූර්ණ අධ්‍යයනයක් සිදු කර වාර්තා කිරීමටත්, ජාතික සහජීවනය තහවුරු කිරීම සහ පීඩාවට පත් පිරිස් වෙත සහන සැලසීම පිළිබඳ සිය යෝජනා සහ නිර්දේශ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත් වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කර සිටියි.

2. (අ) කථානායකවරයා විසින් කාරක සභාවෙහි සභාපතිවරයා සහ සාමාජික මන්ත්‍රීවරයන් නම් කළ යුතු ය; සහ

(ආ) පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 101 හි විධිවිධාන ප්‍රකාරව කාරක සභාව සාමාජික මන්ත්‍රීවරයන් දොළොස් දෙනෙකුට (12) නොවැඩි විය යුතු ය.

3. එම කාරක සභාවට —

(අ) සිය ගණපූරණය නියම කර ගැනීමට ද;

(ආ) ඉහත සඳහන් කරුණු සම්බන්ධයෙන් පුළුල් අධ්‍යයනයක් සිදු කිරීම සඳහා කාරක සභාව විසින් අවශ්‍ය යැයි තීරණය කරනු ලබන පරිදි, ඕනෑම තැනැත්තෙකු එම කාරක සභාව ඉදිරියට කැඳවීමට ද, ඕනෑම ලියවිල්ලක් හෝ වාර්තාවක් ලබා දෙන ලෙසට ඕනෑම තැනැත්තෙකුට නියම කිරීමට ද, එකී සියලු සාක්ෂි ලිඛිතව හෝ වාචිකව, ලබා ගැනීමට ද;

(ඇ) කාරක සභාවේ සහාය පිණිස අදාළ ක්ෂේත්‍රයන්හි විශේෂඥ දැනුමක් ඇති පුද්ගලයන්ගේ සහ ප්‍රවීණයන්ගේ සේවය ලබා ගැනීමට ද; සහ

(ඈ) කලින් කල අන්තර්වාර වාර්තා ඉදිරිපත් කිරීමට ද පාර්ලිමේන්තුව කල් තබනු ලැබ හෝ වාරාවසාන කරනු ලැබ තිබුණ ද රැස්වීම් පවත්වාගෙන යාමට ද,

බලය තිබිය යුතු ය.

4. කාරක සභාවේ වාර්තාව එහි පළමු රැස්වීමේ දින සිට මාස හයක (06) කාලයක් හෝ පාර්ලිමේන්තුව විසින් දීර්ඝ කරනු ලබන එවැනි කාල පරිච්ඡේදයක් ඇතුළත දී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු ය.